*සැ. යු.* —2013.06.07 දින පළවූ අංක 1,814 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,815 - 2013 ජූනි මස 14 වැනි සිකුරාදා - 2013.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I කොටස : (III) වැනි ඡෙදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් … … | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන … … | 370 |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන … … | — |
| කාර්මික සැළසුම් පිළිබඳ නිවේදන … … | — |
| විවිධ දැන්වීම් … … | — |

*සැ. යු.*- (i) ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත 2011 මැයි මස 13 වැනි *දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නො ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූනි මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ.බ.*)

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

369 -B 80737—3,050 (2013/06)
C1-

# වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැදුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට් නිවේදනයේ* දින සිට තුන් මාසයක් ඇතුළත ඇමි 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතු ය.

### ශුද්ධියකි

2013.02.08 වැනි දින අංක 1,797 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 01 වැනි පන්තියට අයත් අංක 127462 දරන ප්‍රමුඛතාව ඉල්ලා සිටින දිනය සහ වෙළඳ ලකුණ පිළිබඳ භාණ්ඩ/සේවා ලැයිස්තුව පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය :-

විෂයාංක—(03) ප්‍රමුඛතාව ඉල්ලා සිටින්නේ නම් දිනය :-

2005—019938 08/03/2005 ජේපී.

විෂයාංක—(07) භාණ්ඩ/සේවා ලැයිස්තුව :-

රසායනික ද්‍රව්‍ය, මැලියම් (ගෘහස්ථ හෝ ලිපිද්‍රව්‍ය ප්‍රයෝජනය සඳහා නොවේ.) පිරියත අම්ල, විධිමත් පිරිසැකසුම්, පොහොර. පිහන් භාණ්ඩ ඔපද්‍රව්‍ය, සණමේද අම්ල, ලෝහ නොවන ඛණිජ වර්ග, ඡායාරූප සැපයීම්, රසායනික පිරික්සුම් කඩදාසි, කෘතිම රසකාරක කාර්මික කටයුතු සඳහා වූ පිටි සහ පල්ප, සකස් නොකළ ප්ලාස්ටික්ස්, පල්ප.

ජී. ආර්. රණවක මහත්මිය,
නියෝජ්‍ය බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලයය.
" සමාගම් මැදුර", 3 වැනි මහල,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06-174 — 2013.06.14 වැනි අංක 1,815 දරන *ගැසට් පත්‍රය*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.